කැකිරාව ප්‍රාදේශීය සභාව
අනුරාධපුර දිස්ත්‍රික්කය

----------------------------

01. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 22 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 10 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 04 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කැකිරාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ ඉවත්කර තිබුණු රු.1,214,381 ක් වූ පුස්තකාල පොත් වටිනාකම ගිණුම්වලින් ඉවත්කර නොතිබුණි. | ඉවත් කල පුස්තකාල පොත් වටිනාකම ගිණුම්වලින් ඉවත්කල යුතුවේ. | පිළිගනිමි. |
| (ii) | ප්‍රාදේශීය සභා කාර්යාල තාප්පය ඉදිකිරීම වෙනුවෙන් වැයකල රු.1,957,776 ක් ප්‍රාග්ධනගත කර නොතිබුණි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | එකඟවේ. |
| (iii) | රු.6,221,373 ක් වූ කම්පැක්ටර් රථයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | එකඟවේ. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ රු.3,575,357 ක ස්ථාවර තැන්පතු උපලබ්ධි කරගෙන තිබුණද මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර තැන්පත් වටිනාකමින් අඩුකර දක්වා නොතිබුණි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | එකඟවේ. |
| (v) | සභාවේ සේවය කරනු ලබන අනියම් හා තාවකාලික සේවකයන් 19 දෙනකු වෙනුවෙන් රු.1,043,972 ක පාරිතෝෂික වෙන්කිරීම් සිදුකර නොතිබුණි. | ගිණුම්වල පාරිතෝෂික වෙන්කිරීම් සිදුකල යුතුවේ. | පිළිගනිමි. |

| | | |
|---|---|---|
| (vi) සමාලෝචිත වර්ෂයේ විද්‍යාතා මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීමේ වියදම් රු.781,775 ක් ප්‍රාග්ධනගත කර නොතිබුණි. | වත්කම් හඳුනාගෙන ප්‍රාග්ධනගත කලයුතු වේ. | එකඟවේ. |

(ආ) අසම්භාව්‍ය බැරකම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට සභාවට එරෙහිව බාහිර පාර්ශවයන් 07 ක් හා සභාව විසින් බාහිර පාර්ශවයන් 05 කට නඩු පවරා තිබුණු අතර ඒ පිළිබඳව තොරතුරු මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි. | අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(i) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| • වර්ෂ දෙකක් ඉක්මවූ රු.5,716,715 ක කර්මාන්ත ණයගැති වටිනාකමක් අයකර ගෙන නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | එකඟවේ. |
| • වර්ෂ තුනක් ඉක්මවූ රු.1,000,902 ක හිඟහිටි බදුකුලී වටිනාකමක් අයකර ගෙන නොතිබුණි. | හිඟහිටි බදුකුලී අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | එකඟවේ. |

(ii) ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ දෙකක් ඉක්මවූ රු.884,102 ක කර්මාන්ත ණයහිමි වටිනාකමක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කලයුතු වේ. | එකඟවේ. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

තොරතුරු ඉදිරිපත් නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.1,291,537,373 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාලව පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ සනාථ කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | එකඟවේ. |

1.4 අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 571 | වර්ෂ දෙකක් ඉක්මවූ රු.101,870 ක් වටිනා තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කලයුතු වේ. | එකඟවේ. |
| (ආ) | 2006 නොවැම්බර් 14 දිනැති අංක PL/07/01/53 දරන පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ | | | |
| (i) | අංක 09 | සුසාන භූමි ලේඛන නඩත්තු කිරීම, ප්‍රකාශයට පත්කිරීම හා තාප්ප වැටවල් යොදා ආරක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. | නීති,රීති,රෙගුලාසි අනුව කටයුතු කලයුතු වේ. | එකඟවේ. |
| (ii) | අංක 06 2.2(iii) | අඛණ්ඩව ක්‍රියාත්මක වන මාර්ග නඩත්තු ක්‍රමයක් අනුගමනය කර නොතිබුණි. | නීති,රීති,රෙගුලාසි අනුව කටයුතු කලයුතු වේ. | එකඟවේ. |
| | | සභාවට අයත් මාර්ග ගැසට් කර නොතිබුණු අතර ගෙනයා හැකි උපරිම බර ප්‍රදර්ශනය කර නොතිබුණි. | නීති,රීති,රෙගුලාසි අනුව කටයුතු කලයුතු වේ. | එකඟවේ. |

02. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.31,850,128 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.16,427,119 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 7,580,229 | 8,194,780 | 8,962,564 | 4,390,740 | 7,775,156 | 7,811,522 | 6,899,556 | 5,158,524 |
| (ii) | කුලී | 8,293,360 | 6,341,619 | 6,251,216 | 392,510 | 7,712,662 | 5,937,287 | 5,899,927 | 302,107 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,988,300 | 4,784,173 | 4,784,173 | - | 4,501,101 | 4,392,295 | 4,392,295 | - |
| (iv) | වෙනත් ආදායම් | 26,975,780 | 38,185,782 | 1,152,740 | 86,531,567 | 30,739,000 | 21,823,589 | 43,069,301 | 49,498,525 |
| | එකතුව | 47,837,669 | 57,506,354 | 21,150,693 | 91,314,817 | 50,727,919 | 39,964,693 | 60,261,079 | 54,959,156 |

2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2004 වර්ෂයේ තක්සේරුව මත සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වරිපනම් බදු අයකර තිබුණි. | නව තක්සේරුවක් සිදුකර ඒ මත වරිපනම් අයකල යුතු වේ. | එකඟවේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,502,610 ක් වූ හිඟ වරිපනම් බදු අයකර ගෙන නොතිබුණි. | හිඟ බදු අයකර ගැනීමට පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | එකඟවේ. |

2.2.3 කුලී

-----

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------- | ------------------------- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ රු.497,460 ක් වූ බිල්කල කඩකුලී ආදායමින් රු.194,243 ක් පමණක් රැස්කරගෙන තිබුණු අතර ගිවිසුම්වල කොන්දේසි ඇතුළත් කර නොතිබීම හේතුවෙන් ඉතිරි හිඟය රු.303,217 ක් අයකර ගෙන නොතිබුණි. | හිඟ කඩකුලී අයකර ගැනීමට පනතේ 159 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | එකඟවේ. |
| (ආ) | හිඟ බදු කුලී රු.263,542 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ කඩකුලී අයකර ගැනීමට පනතේ 159 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | නඩු පවරා ඇත. |

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | -------------- | --------------------------- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.50,090,226 ක් හා මුද්දර ගාස්තු රු.4,373,600 ක් විය. | ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු ලබාගැනීමට කටයුතු කල යුතුවේ. | එකඟවේ. |

03. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

3.1 කාර්ය සාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා පොදු මංමාවත් පිළිබඳ කාරණය, විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධන යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------- | ----------------------------- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු නමුත් 2019 දෙසැම්බර් 31 දිනට අදාල කාරණා 18 ක් සඳහා සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | පනත අනුව අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කල යුතු වේ. | කාරණා 10 ක් සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ඇත. |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ එක්රැස්වන කැලි කසළ බල ප්‍රදේශයේ හබරණ සෙවනගම හා ඇඹුල්ගස්වැව යන ස්ථාන දෙකකට වර්ග කිරීමකින් තොරව අවිධිමත්ව මුදාහරිමින් පැවතුණි. | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත අනුව කසළ කළමනාකරණය කලයුතු වේ. | පිළිගනිමි |

(ඇ) පාරිසරික ගැටළු
------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කැලි කසළ ස්ථාන දෙකකදී අවිධිමත්ව බැහැර කිරීම නිසා විශාල පාරිසරික හානියක්ද, පොලිතීන් හා ප්ලාස්ටික් දහනය කිරීම තුළින් විශාල වායු දූෂණයක් හා එම අපද්‍රව්‍ය ආහාරයට ගන්නා වන සතුන්ට සෞඛ්‍ය තර්ජනයක් ද පැවතුණි. | 2017 සැප්තැම්බර් 01 දිනැති අංක 2034/36 අති විශේෂ ගැසට් නිවේදනයේ නියෝග සහ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතට අනුව සභාව කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි |

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක
----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි. | 2030 තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට අදාල වන කාර්යය හා කර්තව්‍ය සභාව විසින් ඉටු කලයුතු වේ. | පිළිගනිමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හබරණ නගරයේ වූ කඩකාමර 05 ක් 2018 ජූලි 10 වන දින වනවිට අතුරු බදු දී තිබුණි. මෙම අතුරු බදුදීම් තහනම් බවට ගිවිසුම් වල කොන්දේසියක් ඇතුලත් නොකිරීම හේතුවෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකිවී තිබුණි. | ගිවිසුම්වල අතුරු බදුදීම තහනම් බවටත් අතුරු බදුදීම කර තිබුණු විට අනුගමනය කරන ක්‍රියාමාර්ග ද ඇතුළත් කර කොන්දේසි පැනවිය යුතු වේ. | බදුකරුවන් විසින් සභාවට එරෙහිව නඩු පවරා ඇත. |

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි ආයතනවල වාර්ෂික ආදායමෙන් අයකල යුතු සියයට 1 දක්වා වූ වෙළඳ බලපත්‍ර ගාස්තුව තීරණය කිරීමේදී එම ආයතනවල විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ආදායම පදනම් කරගෙන නොතිබුණි. | පනත අනුව කටයුතු කලයුතු වේ. | පිළිගනිමි. |

3.4 මතභේදයට තුඩුදෙන කරුණු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට රු.48,859,956 ක් වූ ඉඩම් සහ ගොඩනැගිලිවල වටිනාකම සභාව විසින් පත්කර තිබුණු කමිටුවක තක්සේරුවක් පදනම්ව රු.1,227,471,000 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම නිසා ස්ථාවර වත්කම්වල වටිනාකම සියයට 2412 කින් වැඩිවී තිබුණි. | සුදුසුකම් ලත් තක්සේරු කරුවන්ගෙන් සමන්විත කමිටුවක් මගින් වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කලයුතු වේ. | අදහස් දක්වා නොමැත. |

3.5 වත්කම් කළමනාකරණය

3.5.1 නඩත්තු හා අළුත්වැඩියා සිදුනොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගතහැකි මට්ටමේ පවතින රු.2,165,000 ක් වටිනා ට්‍රැක්ටර් 04 ක්, වතුර බවුසර් ටේලර් 03 ක්, පස්තලනයක් හා යතුරුපැදි 02 ක් සභා පරිශ්‍රයේ ගාල්කර පැවතුණි. | අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කලයුතු වේ. | පිළිගනිමි. |

3.5.2 පවරානොගත් වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව භාවිතා කරන සභාව සතුයැයි ලේඛනවල ඇතුලත් ප්‍රමාණය අක්කර 31 රූඩ් 2 පර්චස් 8 ක් වූ ඉඩම් කැබැලි 24 ක අයිතිය පවරාගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | සභාව සතු ඉඩම් සභාවට පවරා ගැනීමට කටයුතු කළයුතු වේ. | එකඟවේ. |
| (ආ) | සභාව සතු වටිනාකම රු.490,000 ක් වූ ට්‍රැක්ටර් ටේලර් දෙකක් සහ වතුර බවුසර් දෙකක් ලියාපදිංචි නොකර ධාවනයේ යොදවා තිබුණි. | සියළුම වාහන ලියාපදිංචි කළයුතු වේ. | එකඟවේ. |

3.5.3 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2004 හා 2005 වර්ෂ වලදී රු.2,500,000 ක වියදමින් ඇඹුල්ගස්වැව ස්ථානයේ ඉදිකර තිබුණු කසල කළමනාකරණ අංගනය හා ජීරක ටැංකි 04 ප්‍රයෝජනයට නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි. | නිශ්ක්‍රීය වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. කොම්පෝස්ට් පොහොර සැකසීම සඳහා භාවිතා කිරීම සඳහා ශුද්ධ පවිත්‍ර කර සූදානම් කර ඇත. |
| (ආ) | සභාව සතු රු.7,605,000 වටිනා ගොඩනැගිලි 06 ක් ප්‍රයෝජනයට නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි. | නිශ්ක්‍රීය වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |